DOI: 10.31357/fhssmph.2004.00081

# "ශ්‍රී ලංකාවේ කතිකාවත් තුළින් හෙළිවන භික්ෂු සංවිධානයේ කළමනාකරණය."

අබේසූරිය මහපටබැඳිගේ තිමල් වසන්ත මෙන්ඩිස්

ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයේ පශ්චාද් උපාධි අධ්‍යයනාංශයේ දර්ශනපති (බෞද්ධ ශිෂ්ටාචාරය) උපාධිය සම්පූර්ණ කිරීම සඳහා ඉදිරිපත් කරනු ලබන පර්යේෂණ නිබන්ධය.

**2004.05.03**

ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ (ලි.ප.අංකය : GS/SS/530/98(බෞද්ධ ශිෂ්ටාචාරය)) දර්ශනපති උපාධිය සඳහා "ශ්‍රී ලංකාවේ කතිකාවත්වලින් හෙළිවන භික්ෂු සංවිධානකරණයේ කළමනාකරණය." නම් වූ නිබන්ධය මාගේ ස්වාධීන නිබන්ධයක් බවත්, උපදේශක මහතුන්ගේ උපදෙස්වලට අනුව මවිසින් ම ලියන ලද ග්‍රන්ථයක් බවත් සහතික කරමි.

දර්ශනපති උපාධි අපේක්ෂක.

(ලි.ප.අ. SGS/SS/530/98)

ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ දර්ශනපති උපාධිය සඳහා (ලි.ප.අංකය : GS/SS/530/98(බෞද්ධ ශිෂ්ටාචාරය)) "ශ්‍රී ලංකාවේ කතිකාවත්වලින් හෙළිවන භික්ෂු සංවිධානකරණයේ කළමනාකරණය." නම් වූ නිබන්ධය ස්වාධීන නිබන්ධයක් බවත්, ඔහු විසින් මාගේ උපදෙස්වලට යටත්ව ලියන ලද ග්‍රන්ථයක් බවත් සහතික කරමි.

(මහාචාර්ය චන්ද්‍රිම විජේබණ්ඩාර )

ප්‍රධාන උපදේශක

ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ දර්ශනපති උපාධිය සඳහා (ලි.ප.අංකය : GS/SS/530/98(බෞද්ධ ශිෂ්ටාචාරය)) "ශ්‍රී ලංකාවේ කතිකාවත්වලින් හෙළිවන භික්ෂු සංවිධානකරණයේ කළමනාකරණය." නම් වූ නිබන්ධය ස්වාධීන නිබන්ධයක් බවත්, ඔහු විසින් මාගේ උපදෙස්වලට යටත්ව ලියන ලද ග්‍රන්ථයක් බවත් සහතික කරමි.

(ආචාර්ය එච්. එම්. ජ්. හේරත්)

සහාය උපදේශක

පශ්චාද් උපාධි අධ්‍යයන පීඨය
MAY 2004
ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය

පශ්චාද් උපාධි අධ්‍යයන පීඨය
24 AUG 2005
ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය

## හැඳින්වීම.

මිනිසාට තම මූලික අවශ්‍යතාවයන් තනිව සපුරා ගත නො හැකි හෙයින් සාමූහිකව සිය අභිප්‍රායයන් සඵල කර ගැනීමට උත්සාහ කිරීමේ ප්‍රතිඵලයක් වශයෙන් "මිනිස් සමාජ" නිර්මාණය කර ගනී. පොදු අරමුණක් උදෙසා මෙලෙස බිහි වන සමාජ කණ්ඩායම් එකී කණ්ඩායම්වල මූලික අභිමතාර්ථයන් ඉටුකර ගැනීම උදෙසා "සංවිධාන" (Organi ation– නිර්මාණය කර ගනී. සංවිධානයක් වූකලී එකිනෙකට සම්බන්ධ ක්‍රියාවන් මඟින් අභිමත පරමාර්ථ මුදුන්පත් කර ගැනීම අරභයා බිහිවන මනුෂ්‍යමය හා ද්‍රව්‍යමය සම්පත් ඒකරාශී වූ ක්‍රමයකි. ඒ අනුව අරමුණු පරමාර්ථ සහිත පුද්ගලයන්ගෙන් සමන්විත , විධිමත් නීතිරීති පද්ධතියක් තිබීම සංවිධානයක පොදු වූ මූලික ලක්ෂණ වේ. එකී සංවිධානයන්හි පරමාර්ථයන් ළඟා කර ගැනීම සඳහා අනුගමනය කරනු ලබන විධිමත් ක්‍රියාපිළිවෙල **"කළමනාකරණය"**(Management) ලෙස සරලව හැඳින්විය හැකි ය. මේ අනුව ආයතනයේ අරමුණු පරමාර්ථ ඉටුකර ගැනීම සඳහා ආයතනය සතු මානුෂික හා ද්‍රව්‍යාත්මක සම්පත් වඩාත් කාර්යක්ෂම හා සඵලදායීව යෙදවීමේ ක්‍රියාවලිය කළමණාකරණය වේ. ඒ සඳහා පැහැදිලි සැලැස්මක් සංවිධානය කිරීමත් නායකත්වයක් හා පාලනයක් තිබීම අත්‍යවශ්‍ය ය. ඒ වගේ ම සමාජයක් සංවිධානාත්මක බවට පත් කරනු ලබන බලය වනුයේ ද කළමනාකරණයයි. කළමනාකරණයක් නො මැති නම් හොඳ සංවිධානාත්මක සමාජයක් ද නො මැත . මේ අනුව කළමනාකරණය යනු (Management) පරමාර්ථයන් මුදුන් පමුණුවා ගැනීම උදෙසා දක්ෂ හා විචක්ෂණාත්මක ලෙස ඊට අදාල සම්පත් මැනවින් යොදා ගැනීම/මෙහෙයවීම බව පැහැදිලි ය.

කළමනාකරණය (Management) ක්‍රමිකව විකාශය වීමේ ප්‍රතිඵලයක් වශයෙන් විෂයයක් ලෙස සකස් වූයේ 19 වන සියවසයේ මුල් භාගයේදී පමණ ය. මෙම විෂයෙහි දක්නට ලැබෙන එක් මූලික ලක්ෂණයක් වනුයේ කළමනාකරණ ක්‍රියාවලියක්වීම ය. එම

ක්‍රියාවලිය තුළ සැලසුම්කරණය (Planing-”සංවිධානකරණය, (Organization- මාණ්ඩලිකරණය -Staffing) මෙහෙයවීම :Directing- හා පාලනය (Control) යන මූලධර්ම ප්‍රධාන අංග ලෙස සැලකේ. විධිමත් විෂයයක් ලෙස වර්ධනය වීමෙන් අනතුරුව මෙම මූලධර්ම හඳුන්වා දෙනු ලැබුවත් මිනිසා සංවිධානගත වූයේ කවදා ද එතැන් සිට ම මෙම ක්‍රියාවලිය සෑම සමාජයක් තුලම පැවති බවට ඉතිහාසය සාක්ෂි දරයි.

ශ්‍රී ලංකාවේ බුදු සසුනෙහි ඉතිහාසය පිරික්සීමේදී වැදගත්වන ප්‍රධාන එක් සාධකයක් වනුයේ "කතිකාවත්" ය. මන්ද ථෙරවාද බුදුසමය ශ්‍රී ලංකාවේ රෝපණය කරන ලද නමුත් පසු කාලයේ සහ සසුන ව්‍යාප්තවීමේ දී භික්ෂූන් වහන්සේලා අතර ම ඊට පටහැනිව විෂම අදහස් ආකල්ප හා ක්‍රියාකාරකම් ඇති වීමයි. ඒ ඒ කාලවල වැඩ විසූ සුපේශල ශික්ෂාකාමී භික්ෂූන් වහන්සේගේ හා රජවරුන්ගේ දායකත්වයෙන් එවැනි හේතු සාධක සමාලෝචනය කොට භික්ෂු දුෂ්ප්‍රතිපත්ති ඉවත් කිරීමත් භික්ෂුව භික්ෂුවක් ලෙස සකස් කළ යුත්තේ කෙසේද යන්නත් සාකච්ඡා කොට එසේ කතිකා කරගත් පරිදි භික්ෂුව සකස් වියයුතු බවත් ඒ අනුව පාලනය විය යුතු බවත් තීරණය කරන ලදි. එලෙස භික්ෂුව අනුගමනය කළයුතු ක්‍රියාපිළිවෙත සෙල් ලිපියක් වශයෙන් හෝ පුස්කොළ පොතක් වශයෙන් ලියා තබන ලද අතර ඒවා හඳුන්වනු ලබන පොදු නාමය වූයේ "කතිකාවත් " යන්නයි.

ක්‍රි. පූ. 3 වන සියවසයේ සිට ක්‍රි. ව. 2 වන සියවස පමණ දක්වා ම භික්ෂුව ගත කරනු ලැබුවේ ගල් ලෙන්වල ය. ක්‍රි.ව. 6වන සියවසයෙහි පැවති ආර්ථික දේශපාලනික අස්ථාවර භාවයන්හිදී භික්ෂු සංස්ථාව ස්ථාවරව පවත්වාගෙන යෑම සඳහා බුදු දහම කෙරෙහි පැහැදුණු රජවරුන්. දායක දායිකාවන් විශාල ප්‍රමාණයේ ප්‍රත්‍ය පහසුකම් ලබා දෙනු ලැබූ නිසාම විශාල ප්‍රමාණයේ ආරාමවල වාසය කිරීමටත්. බුදු දහම

හා සසුන ආරක්ෂා කිරීම රජුගේ ක්‍රියාවක් වූ හෙයින් රාජ්‍ය භාණ්ඩාගාරයෙන් ප්‍රත්‍ය පහසුකම් ලබාදීම වෙනුවට රජය සතු ඉඩම් වැව්, කුඹුරු ආදිය පමණක් නොව මුදල් ද පරිත්‍යාග කිරීමත් නිසා විශාල ඉඩම් ප්‍රමාණයකුත් , එම භෞතික සම්පත්වලින් ලැබෙන ආදායම ද වර්ධනයවීම නිසාත් ඇතැම් භික්ෂූන් වහන්සේලා භික්ෂු ප්‍රතිපත්ති අමතක කොට ලෞකික ජීවිතයට හුරුවන්නට උත්සාහ කළහ. බුදු සසුනෙහි පැවැත්ම උදෙසා ලබා දී ඇති භෞතික දේපල පිළිබඳව ඇති වූ ගැටළුවලට විසඳුමක් ලෙස ඉදිරිපත් වූ සැලැස්ම වූයේ ද මේ කතිකාවත් ය.

මේ අනුව භික්ෂු ජීවිතය හා බුදු සසුනෙහි පැවැත්ම උදෙසා පවතින දේපල පාලනය කිරීම සඳහා සැලසුම්කරණය හා පාලනය කිරීමට උපයෝගී කොට ගෙන ඇත්තේ කතිකාවත් ය. කළමනාකරණයෙහි මූලික ලක්ෂණ හා කතිකාවත් අන්තර්ගත ක්‍රියාපිළිවෙල අතර සමානතාවයක් දැක්වෙන හෙයින් ක්‍රි.ව. 8 වන සියවසයේ සිට 15 වන සියවස දක්වා වූ කාලපරිච්ඡේදය තුළ ශ්‍රී ලංකාවේ බිහි වූ කතිකාවත් මූලික කර ගෙන," ශ්‍රී ලංකාවේ කතිකාවත්වලින් හෙළිවන භික්ෂු සංවිධානකරණයේ කළමනාකරණය " නම් වූ මාතෘකාව යටතේ දර්ශනපති උපාධිය සඳහා පර්යේෂණ අධ්‍යයනය කරන ලදි.

මෙම අධ්‍යයනයෙහි මූලික අභිප්‍රාය වූයේ කතිකාවත්හි අන්තර්ගත කරුණු අනුව එය තත්කාලීන කළමනාකරණ ප්‍රතිපත්තියක් බව අධ්‍යයනය කිරීමයි. ක්‍රි.ව. 8 වන සියවසයේ සිට 15 වන සියවසය දක්වා සකස් කරන ලද පොළොන්නරු කතිකාවත , දඹදෙණි කතිකාවත , පොළොන්නරු හැටදාගෙයි පුවරු ලිපිය, Vවන කාශ්‍යප රජුගේ

අනුරාධපුර පුවරු ලිපිය, වෙස්සගිරි පුවරු ලිපිය අංක 1 හෙවත් වීරංකුරාරාම ලිපිය, උදයමහයාගේ පුලියන්කුලම ලිපිය, 1v වන සේන රජුගේ කළුදියපොකුණ ලිපිය, 1v වන මිහිඳු රජුගේ අභයගිරි පුවරු ලිපිය අංක 2, 1v වන මිහිඳු රජුගේ වෙස්සගිරි පුවරු ලිපිය අංක 2, 1Vවන මිහිඳු රජුගේ මිහින්තලා පුවරු ලිපිය, හා අභයගිරි සංස්කෘත ලිපිය යන කතිකාවත් ශ්‍රී ලංකාවේ භික්ෂු සංවිධානකරණය කළමනාකරණය කිරීමට උපයෝගී කොටගත් බවත් විධිමත් ලෙස කළමනාකරණ මූලධර්ම ඉදිරිපත්ව නොතිබූ කාලපරිච්ඡේදයක කළමනාකණයේ මූලික මූලධර්ම මැනවින් උපයෝගී කොට ගෙන වඩාත් සාර්ථක අන්දමින් භික්ෂුව හා ආරාම පාලනය සිදුකර තිබේද යන්න අධ්‍යයනය කිරීම ය.

ශ්‍රීමත් ඩී. බී. ජයතිලක මහතා,1922 වර්ෂයේදී "කතිකාවත් සඟරා" නමින් ප්‍රථම වරට කතිකාවත් සම්බන්ධයෙන් ග්‍රන්ථයක් සම්පාදනය කරනු ලැබූහ. ඊට පසුව මහාචාර්ය ඡේ. වී. සුරවීර මහතා ද "සිංහල කතිකාවත් හා භික්ෂු සමාජය" මාතෘකාව යටතේ ද මහාචාර්ය නන්දසේන රත්නපාල මහතා ද "The Katikavatas" කෘතිය සම්පාදනය කොට තිබේ. මෙම ග්‍රන්ථ දෙකම සම්පාදනය වූයේ 1971 වර්ෂයේදී ය. ඉන් අනතුරුව 1974 දී මැන්ඩිස් රෝහණදීර මහතා "ශ්‍රී ලංකාවේ සංඝ සංවිධානය" නම් වූ මාතෘකාව යටතේ ක්‍රි.ව. 12 - 14 සියවස්වල ලියැවුණු කතිකාවත් ඇසුරු කරගෙන තොරතුරු ගවේෂණය කර ඇති අතර යටදොළවත්තේ ධම්මවිසුද්ධි හිමියන් ද පොළොන්නරු හා දඹදෙණි කතිකාවත් මඟින් පොළොන්නරු හා දඹදෙණි යුගවල භික්ෂු සමාජය පිළිබඳව අධ්‍යයනය කොට තිබේ.

කතිකාවත් අධ්‍යයනය කිරීමේ දී පැහැදිලි වන කරුණක් වනුයේ ඒ පිළිබඳව විවිධ අංශවලින් පර්යේෂණ සිදු කර තිබුණත් තවදුරටත් අධ්‍යයනය කළ හැකි ක්ෂෙත්‍ර දක්නට ලැබෙන බවයි. ඒ අනුව ක්‍රි. ව. 8 වන සියවසයේ සිට 15 වන සියවස දක්වා ලියැවුණු කතිකාවත් උපයෝගී කොට ගෙන , භික්ෂු සංවිධානකරණයේ කළමනාකරණය පිළිබඳව මෙතෙක් පර්යේෂණාත්මක අධ්‍යයනයක් සිදු කොට නො මැත . එබැවින් මෙම මාතෘකාව පර්යේෂණ සඳහා තෝරා ගන්නා ලදි.

මෙම නිබන්ධය පරිච්ඡේද පහකින් සමන්විත වන අතර පළමු පරිච්ඡේදයේ දී කළමනාකරණය, එහි ආරම්භය හා විකාශය පිළිබඳව අධ්‍යයනය කර ඇත . එහි දී "කළමනාකරණය" යන වචනයෙහි අර්ථය, ශබ්ද කෝෂ, විශ්ව කෝෂ හා මෙම විෂයෙහි විද්‍යාඥයින් ඉදිරිපත් කරන ලද මත සමාලෝචනය කොට පොදු විෂයයක් වන බව ගවේෂණය කරන ලදි. නූතන කළමනාකරණයෙහි ප්‍රධානතම මූලධර්ම මත සැලසුම් කිරීම, සංවිධාන කිරීම නායකයෙකු හා පාලනය යන සංකල්ප අතීතයේදීත් භාවිත වූයේ ද යන්නත් මෙහිදී පර්යේෂණයට ලක් නායකයකත්වය හා පාලනය යන සංකල්ප අතීතයේදීත් භාවිත වූයේ ද යන්නත් මෙහිදී පර්යේෂණයට ලක් කොට ඇත. සෑම කටයුත්තකම සාර්ථකත්වයට කළමනාකරණය යොදා ගැනීම හේතුවන බවට අවධානය යොමු කරමින් අතීතයේ ආගමික දේශපාලනික හා ආර්ථික ක්ෂෙත්‍රයන්හි දියුණුවක් ඇති වූයේ මේ විෂයෙහි දායකත්වය නිසා බවත්, විශේෂයෙන් ම ආගමික අංශයන් හී මෙම ලක්ෂණය විද්‍යමාන වන බවත් පළමුවන පරිච්ඡේදයේ අධ්‍යයනය කොට ඇත .

දෙවන පරිච්ඡේදයේ දී අවධානය යොමු කරන ලද්දේ කතිකාවත් හැඳින්වීම සඳහා ය. එහිදී කතිකාවත්වල ආරම්භය හා විකාශය පිළිබඳවත්. කතිකාවත් හා කළමනාකරණය අතර ඇති සම්බන්ධය කෙසේ ද යන්න පර්යේෂණයට ලක් කිරීමට උත්සාහ ගෙන තිබේ. කතිකාවත් යනු කවරක් ද යන්න අධ්‍යයනය කිරීමේදී ශබ්ද කෝෂ, විශ්වකෝෂ, ආගමික ග්‍රන්ථ මෙන් ම විද්වතුන් ඉදිරිපත් කර ඇති මතයන් සමාලෝචනයට ලක් කරමින් මෙය "අනාගත සැලැස්මකි' යන්න අධ්‍යයනය කොට ඇත

කතිකාවත්වල අන්තර්ගත කරුණු අනුව ශාසන කතිකාවත් හා විහාර කතිකාවත් යනුවෙන් වර්ග දෙකකට බෙදනු ලැබේ. භික්ෂූන් වහන්සේලා උදෙසා පනවන ලද ව්‍යවස්ථා ශාසන කතිකාවත් යනුවෙනුත් විහාර සේවකයන් හා රජයේ නිලධාරීන් සඳහා පනවන ලද ව්‍යවස්ථා විහාර කතිකාවත් යනුවෙනුත් විග්‍රහ කෙරේ. නමුත් මෙය පර්යේෂණයට ලක් කිරීමේදී භික්ෂූන් වහන්සේලා උදෙසා ම පැනවූ ව්‍යවස්ථා දෙකක් දක්නට ලැබෙන නමුත් ආරාම සේවකයන් හා නිලධාරීන් සඳහාම සකස් කළ කතිකාවත් දක්නට නො ලැබෙන බවයි. භික්ෂූන් වහන්සේලා වෙනුවෙන් සකස් කරන ලද කතිකාවත්වල ආරාම සේවකයන් සඳහා ද ව්‍යවස්ථා සකස් කොට තිබෙන හෙයින් කතිකාවත් යනු එකම වර්ගයක් බවත් මෙහිදී අධ්‍යයනය කොට ඇත .

කතිකාවත්වල ඉතිහාසය සෙවීමේ දී ක්‍රි. ව. 3 වන සියවස වූ මහසෙන් රාජ්‍ය සමය දක්වා දිවෙන බවත් මෙතෙක් ප්‍රසිද්ධියට පත් නොවූ එහෙත් මතයක් පමණක් වූ "ධම්ම කම්ම" හෙවත් මහසෙන් රජුගේ හේරත් හල්මිල්ලෑව ලිපිය කතිකාවත්වල ආරම්භක කතිකාවත ලෙසත් සැලකිය හැකිය. ඊට පෙරත් එබඳු ලිපි තිබිය හැකිය.

දැනට සොයා ගෙන ඇති අන්දමට ලක්දිව සමස්ත භික්ෂූන් වහන්සේලා කෙරෙහිම බලපාන පරිදි කතිකාවතක් සකස් වූයේ පොළොන්නරුවේ පරාක්‍රමබාහු රජු

දවස ය. කතිකාවත්වල අන්තර්ගත කරුණුවල ස්වභාවය අනුව ඒවා සකස් වූයේ භික්ෂු සංස්ථාව තුළ හා ආරාම පාලනයේදී ඇති වූ ගැටළුවලට විසඳුමක් වශයෙනි. එසේ නම් කතිකාවත් යනු අනාගත වැඩපිළිවෙලකි. එම වැඩපිළිවෙල ක්‍රියාත්මක කරවන ආකාරයත් ක්‍රියාත්මකවීමේ දී කෙසේ පාලනය කළයුතු ද යන්න දැක්වෙන පාලනමය නීතිරීති ද ඇතුළත් ය. භික්ෂුව හා ආරාම නිලධාරීන් - සේවකයන් විධිමත් ලෙස සංවිධානගත කිරීමක්, මෙහෙයවීමක් සිදු කිරීම සඳහා සකස් කළ සැලැස්මක. එම නිසා කතිකාවත් පැවැත්වීම කළමනාකරණ මූලධර්ම වලට අනුකූලව කටයුතු කිරීමක් ලෙසද මෙම පරිච්ඡේදයේදී ද අධ්‍යයනය කොට තිබේ.

කතිකාවත් මගින් භික්ෂූන් වහන්සේලා කළමනාකරණය කිරීමට පසුබිම සකස් වූයේ බුදුන් වහන්සේගේ කළමනාකරණ න්‍යාය පදනම් කරගෙන බව උපකල්පනය කරමින් පර්යේෂණය කිරීම, හෙවත පරිච්ඡේදයේ දී සිදු කරන ලද අතර එහිදී මූලික කරගනු ලැබුවේ සංවිධානයක් වශයෙන් භික්ෂු සමාජය කළමනාකරණය කර ඇති ආකාරයයිග බුදුන් වහන්සේගේ ශ්‍රාවකයන් පරමාර්ථ දෙකක් සඳහා මෙහෙයවනු ලැබී ය එනම් නිවන් ලබා ගැනීම හා ගිහිජනතාවට එකී ධර්මය පහදාදීමට ක්‍රියා කිරීමයි අරමුණු දෙකක් වුව ද, සංවිධානයක් වශයෙන් සිය ශ්‍රාවකයන් කටයුතු කිරීමේදී හැසිරිය යුතු, ක්‍රියා කළයුතු පිළිවෙල කෙරෙහි අවධානය යොමු කරමින් භික්ෂුවගේ කාර්යභාරය සැලසුම් කොට පාලනය කිරීම උදෙසා බුදුන් වහන්සේ විසින් තම භික්ෂු සංවිධානය මැනවින් කළමනාකරණය කොට ඇත.

එලෙස කළමනාකරණය කිරීමේ දී තීරණ ගැනීමේ ක්‍රියාවලිය වැදගත් කොට සැලකෙන අතර, භික්ෂු සංවිධානයෙන් හා බාහිර සමාජයෙන් බලපෑ සාධක ප්‍රධාන වශයෙන් ම එයට බලපෑ බවත් ඒවාට විසඳුම් ලෙස තම ශ්‍රාවක සමාජය කළමනාකරණය කිරීමේ දී කෙටි කාලීන හා දිගු කාලීන සැලසුම් අනුගමනය කර ඇති බවත්, ක්‍රි. පූ. 6

වන සියවසයේ  බුදු සසුනෙහි කළමනාකරණය කෙසේ පැවතියේ ද යන්න අධ්‍යයනය කරනු ලැබ ඇත.

"කතිකාවත්වලින් හෙළිවන භික්ෂු සංවිධානකරණය පිළිබඳ කළමනාකරණය" පිළිබඳව සිව්වන පරිච්ඡේදයේ දී අධ්‍යයනය කරනු ලැබේග ලාංකීය භික්ෂු සමාජය විකාශය වීමේදී දේශපාලන ආර්ථික හා සමාජයීය හේතු මෙන් ම භික්ෂූන් වහන්සේලා තුළ බුද්ධ විනයට හා ධර්මයට පටහැනිව විවිධ විෂම අදහස් මතු වන්නට වියග  බුදු දහම ලංකාවට පැමිණීමෙන් අනතුරුව මිනිසාගේ සෑම ක්ෂේත්‍රයකට ම මූලික වූයේ බුදු දහමයි.  මෙලෙස භික්ෂු ප්‍රතිපත්ති බුද්ධ විනයට විරුද්ධ වනවිට ඒවා මැඩපවත්වීම උදෙසා සකස් කරන ලද කතිකාවත්වල අන්තර්ගත වනුයේ  අනාගත භික්ෂු සංවිධානය ක්‍රමවත් කිරීමේ වැඩපිළිවෙලකි.

මෙහි මූලික අරමුණ වූයේ එතෙක් පැවති භික්ෂු දුෂ්ප්‍රතිපත්ති මැඩපැවැත්වීම සඳහා සකස් කරන ලද නීතිමය සංග්‍රහයක් නොව අනාගත භික්ෂු සංවිධානය මනා ලෙස පවත්වාගෙන යාම සඳහා නිර්මාණය කරන ලද ක්‍රමවේදයකි.

ඒ තුළ භික්ෂු සමාජය මැනවින් සැලසුම් කිරීමත් එකී සැලැස්මට අනුකූලවන ආකාරයට සංවිධානගත කිරීමත් අභිමත පරමාර්ථයන්ට සරිලන සේ මෙහෙයවීමත් හා සැලසුම් කරගත් පරිදි පාලනය කිරීමට අවශ්‍යවන ප්‍රතිපත්ති මාලාවක් වන හෙයින් එහි දක්නට ලැබෙන්නේ කළමනාකරණයක් ය,  යන්න මෙහි පර්යේෂණයට ලක් කොට ඇත .

කිසියම් ගැටලුවක් සඳහා විසඳුමක් සෙවීමේ දී පවතින සමාජ තත්වයන් හා අනාගතයෙහි ඇති විය හැකි තත්වයන් පිළිබඳව අධ්‍යයනය කොට තීරණයන්ට එළඹෙන්නේ නම් එය වඩාත් ම නිවැරදි කළමනාකරණයක් ලෙස සැලකිය හැකිය.  ඒ අනුව ලාංකීය භික්ෂු සමාජයෙහි ඇතිව තිබූ ගැටලු නිරාකරණය කර ගැනීම සඳහා බුද්ධ විනය මූලික කර ගැනීමට තීරණය කිරීම කතිකාවත්වල දක්නට ලැබෙන විශේෂ

ලක්ෂණයක් වන අතර ම එවගේම තත්කාලීන සමාජ රටාවට සරිලන ආකාරයට ද තීරණයන් ගෙන ඇති බව පැහැදිලි ය.

ඒ අතර භික්ෂූන් වහන්සේලා උදෙසා නායකත්වයට භික්ෂුවක් පත් කර ගැනීමට දඹදෙණි කතිකාවතෙහි තීරණය කිරීම විශේෂ අවධානයට ලක් වන කරුණක් වන අතරම, ඒ අනුව සැකසුණු සංවිධාන ව්‍යුහයක් නිර්මාණය කිරීම තවත් වැදගත් වෙයි. බුදුන් වහන්සේ භික්ෂුව අභිප්‍රේරණය හෙවත් උනන්දු කරවනු ලැබුවේ නිවන් ලබා ගැනීමට වුවත් කතිකාවත් මගින් උනන්දු කොට ඇත්තේ විදර්ශනා ධුරයට වඩා ග්‍රන්ථකරණය හෙවත් ග්‍රන්ථධුරය සඳහා ය. එම කර්තව්‍ය සඳහා දිමනා ලබාදීමට තීරණය කිරීමත්, විවිධ තනතුරු නාම ඇති කිරීමත් එම තනතුරුවලට පත්විය හැකි ආකාරය පිළිබඳව තොරතුරු දක්වා තිබීමෙනුත් පැහැදිලි වනුයේ බොහෝ සෙයින් මූලධර්ම වලට අනුකූලව වියදම් කටයුතු සිදු කොට ඇති කළමනාකරණ බවයි. ඒ අනුව කතිකාවත්වල අන්තර්ගත කරුණුවලින් පැහැදිලි වනුයේ එය තත්කාලීන කළමනාකරණ ප්‍රතිපත්තියක් බව මෙහිදී අධ්‍යයනයට ලක් කොට ඇත .

ක්‍රි. ව. 8 වන සියවසය වනවිට සසුන වෙනුවෙන් පරිත්‍යාග කරනු ලැබූ භෞතික හා අභෞතික සම්පත්හී වර්ධනය නිසා ඒවා ද විධිමත් සැලැස්මකට අනුකූලව පාලනය කිරීමේ අවශ්‍යතාවය ද පැන නැගී තිබුණි . ඒ අනුව පස්වන පරිච්ඡේදයේ දී අවධානය යොමු කොට ඇත්තේ **"කතිකාවත් තුළින් හෙළිවන ආරාම කළමනාකරණය"** කෙරෙහි ය. භික්ෂු ප්‍රතිපත්ති කෙරෙහි අවධානය යොමු කිරීමෙන් පමණක් සසුනෙහි අනාගතය සැකසිය නො හැකි බව වටහාගත් කතිකා කාරක භික්ෂූන් වහන්සේලා හා රජවරු භික්ෂු ප්‍රතිරූපයට බෙහෙවින් බලපාන භෞතික හා අභෞතික සම්පත් ද කළමනාකරණය කළයුතු යැයි තීරණය කළා යැයි මිහින්තලා පුවරු ලිපිය අභයගිරි සංස්කෘත ලිපිය

අධ්‍යයනය කිරීමේදී පැහැදිලි වන්නකි. පළමුවෙන් ම භික්ෂුව කෙරෙහිත් දෙවනුව ආරාම පාලනය පිළිබඳවත් අවධානය යොමු කොට ඇත .

බුද්ධ කාලීන භික්ෂු සමාජය තුළ මතු නොවුණු මෙම ගැටළුව නිරාකරණය කර ගැනීමට තීරණය කරනු ලැබ ඇත්තේ ආරාම පාලනයෙන් භික්ෂුව ඉවත් කිරීම මගිනි එසේ ඉවත් කිරීම විසඳුමක් නො වන බවත් ඒ සඳහා රාජ්‍ය නිලධාරීන් හා සේවකයන් යෙදවීමට සැලසුම් කිරීම, ආරාම පාලනය සඳහා පිළිගත හැකි වැඩපිළිවෙලක් සකස් කිරීමක් ලෙස සැලකිය හැකි අතරම එම නිලධාරීන් හා සේවකයන් විධිමත් ක්‍රමයට සංවිධානගත කිරීමත් සිදු කොට තිබෙන බව කතිකාවත්වලින් ම අනාවරණය කර ගත හැකිය. නිලධාරීන්ගේ අධීක්ෂණය යටතේ සේවකයන් සේවය කිරීමත් සංවිධාන සැලැස්මකට අනුකූලව ඔවුන්ගේ සේවය ලබාගෙන තිබීමත් ඒ ඒ තනතුරුවල ස්වභාවය අනුව ඊට අනුකූල ලෙස දීමනා ආදිය ලබාදී ඔවුන් අභිප්‍රේරණය සිදු කර ඇති බවත් අභිමත පරිදි සේවය, සේවයක් ලෙස සිදු කිරීමටත් සේවය ලබා ගැනීමට හැකිවන අයුරින් නීති රීති සකස් කිරීමත් වැදගත් වේ. ආරාම කළමනාකරණය සඳහා වන සැලසුම් සකස් කොට ඇත්තේ ඒ වනවිට සමාජයෙහි පැවති සිරිත් විරිත් හා සම්ප්‍රදායන් පදනම් කරගෙන බවත් මෙම පරිච්ඡේදයේදී අධ්‍යයනයට ලක් කොට ඇත .

ආරාම කළමනාකරණයෙහි වැදගත් ම ලක්ෂණය වනුයේ , අයවැය ලේඛනයයි. අයවැය පාලනයය. ඒ ඒ විහාරාරාමවලට ලැබෙන ආදායම් සටහන් කිරීමත් ආරාම ප්‍රතිසංස්කරණ කටයුතු මෙන් ම විහාර සේවකයන්ට ගෙවනු ලබන දීමනා ආදිය ලේඛනගත කිරීමට තීරණය කිරීමත් එම කාර්යභාරය ගිහියෙකුට පවරනු ලැබුවත් භික්ෂුවගේ අධීක්ෂණය යටතේ සිදු කළයුතු යැයි සැලසුම් කිරීමත් අධීක්ෂණ හා පාලන මූලධර්ම වලට අනුකූලව ඉතාම වැදගත් ය. මේ අනුව ආරාම පවත්වාගෙන යාම සඳහා විධිමත් කළමනාකරණයක් අනුගමනය කොට ඇති බවට කතිකාවත්වලින් සාක්ෂි ලැබේ.

පර්යේෂණයට ලක් කරනලද තොරතුරුවලට අනුව කතිකාවත් යනු ක්‍රි. ව. 8 වන සියවසයේ සිට 15 වන සියවස දක්වාවූ කාලය තුළ ක්‍රියාත්මක වූ කළමනාකරණ ප්‍රතිපත්තියක් බවත් ඒ තුළ කළමනාකරණයෙහි මූලික ලක්ෂණයන් ක්‍රියාත්මකව පැවති බවත් නිගමනය කිරීම, හයවන පරිච්ඡේදයේදී සිදුවන අතර ලාංකීය බුදුසසුන අඛණ්ඩව ක්‍රියාත්මක වූයේ කතිකාවත් තුළ කළමනාකරණ ලක්ෂණයන් ක්‍රියාත්මක වූ නිසා බවත් පැහැදිලි ය.

පර්යේෂණයට ලක් කරනලද තොරතුරුවලට අනුව කතිකාවත් යනු ක්‍රි. ව. 8 වන සියවසයේ සිට 15 වන සියවස දක්වාවූ කාලය තුළ ක්‍රියාත්මක වූ කළමනාකරණ ප්‍රතිපත්තියක් බවත් ඒ තුළ කළමනාකරණයෙහි මූලික ලක්ෂණයන් ක්‍රියාත්මකව පැවති බවත් නිගමනය කිරීම, හයවන පරිච්ඡේදයේදී සිදුවන අතර ලාංකීය බුදුසසුන අඛණ්ඩව ක්‍රියාත්මක වූයේ කතිකාවත් තුළ කළමනාකරණ ලක්ෂණයන් ක්‍රියාත්මක වූ නිසා බවත් පැහැදිලි ය.

## ස්තුතිය'

ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ දර්ශනපති උපාධිය සඳහා ඉදිරිපත් කරන " ශ්‍රී ලංකාවේ කතිකාවත් තුළින් හෙළිවන භික්ෂු සංවිධානකරණයේ කළමනාකරණය" නම් වූ මෙම කෘතිය සකස් කිරීමේදී මාගේ ප්‍රධාන උපදේශක උපකුලපති මහාචාර්ය වන්දිම විජේබණ්ඩාර මහතා හා සහාය උපදේශක වශයෙන් කටයුතු කළ කළමනාකරණ පීඨයේ ආචාර්ය එච්' එම්' ඒ' හේරත් මහතා ද කෘතගුණ පූර්වකව සිහිපත් කරමි'

දර්ශනපති උපාධිය හැදෑරීමට මා දිරිමත් කළ පාලි හා බෞද්ධ අධ්‍යනාංශයේ හිටපු අංශ ප්‍රධාන ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය එච්' එම්' මොරටුවගම මහතාට සහ වර්තමාන අංශ ප්‍රධාන මහාචාර්ය ආරියපාල පෙරේරා මහතාට ද මගේ කෘතඥතාවය හිමි විය යුතුය' .

මෙම කෘතිය සකස් කිරීමේදී මාහට සහයෝගය ලබා දුන් බම්බලපිටිය මෙත්තාරාමයේ අම්බලන්තොට චන්දිම හිමි ද, පරිගණක කටයුතු සඳහා සහාය දැක් වූ දෙහිවල - ගල්කිස්ස මහ නගර සභාවේ පරිගණක නිලධාරිණී දමිතා අමරතුංග මහත්මියටත්, පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ අභිලේඛන හා නාණක විද්‍යා නිලධාරී ධම්මිකා ගමගේ මෙනෙවියටත්, සහකාර අධ්‍යක්ෂ (අභිලේඛන හා නාණක විද්‍යා) නාමල් කොඩිතුවක්කු මහතාටත් මගේ ස්තුතිය හිමි වේ.